**හම්බන්තොට නගර සභාව**

**හම්බන්තොට දිස්ත්‍රික්කය.**

**-------------------------**

01. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2011 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 ජනවාරි 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 ජුනි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත මාස 10 ක කාල පරිච්ඡේදයට අදාල විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අප්‍රේල් 30 දින සභාපතිවරයාට යවා ඇත

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව හම්බන්තොට නගර සභාවේ 2011 ජනවාරි 01 දින 2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 ඔක්තෝබර් 31 දිනට හම්බන්තොට නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත්, මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත නිරීක්ෂනයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාල මුද්දර ගාස්තු ආදායම වූ රු. 928,123 ක මුදල ගිණුම්ගත කර නොතිබූ අතර 2010 වර්ෂයට අදාලව ලද රු. 106,000 ක මුදලක් මෙම ගිණුම් කාලපරිච්ඡේදයේ ආදායමට බැරකර තිබුණි.

(ආ) 2011 ජනවාරි 01 දින සිට 2011 ඔක්තෝබර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාල රු. 85,875 ක උසාවි දඩ මුදල ආදායමට බැරකර නොතිබූ අතර 2011 ඔක්තෝබර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් ගණනය කර ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබිණි.

(ඇ) හම්බන්තොට සිනමා ශාලාව බදුදීමෙන් 2011 ඔක්තෝබර් 31 දිනට ලැබිය යුතු රු. 234,369 ක මුදල ගිණුම් වල දක්වා නොතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එකතුව රු. 44,276,945 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

02. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 ජනවාරි 01 දින සිට 2011 ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 759,185 ක් වූ අතර, ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු: 1,332,276 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත කාල පරිච්ඡේදයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත හා ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| (i) | වරිපනම් හා බදු | 3,115 | 1,675 | 1,699 |
| (ii) | බදුකුලී | 5,980 | 207 | 2,437 |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | බලපත්‍ර ගාස්තු | 609 | - | - |
| (iv) | වෙනත් ආදායම් | 3,995 | - | 393 |

2.2.2 වරිපනම් බදු

2011 ඔක්තෝබර් 31 දිනට හිඟ වරිපනම් බදු මුදල රු. 1,841,434 ක් වූ අතර හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා නගර සභා ආඥා පනතේ 170 (1) හා (2) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

2.2.3 කඩකුලී

2011 ඔක්තෝබර් 31 දිනට කඩ කාමර 36 කින් හිඟ කඩකාමර කුලී ලෙස අයවීමට තිබූ රු. 206,790 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2011 ඔක්තෝබර් 31 දිනට උසාවි දඩ හා මුද්දර ගාස්තු ලෙස එකතුව රු. 1,013,998 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

2.3 නිෂ්ක්‍රීය භෞතික සම්පත්

ට්‍රැක්ටර් 02 ක් සහ යතුරු පැදියක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවති අතර 2003 ජනවාරි 03 දිනැති අංක 353(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුනාමියෙන් විපතට පත්වූ කතෝලික සුසාන භූමියේ මායිම් තාප්පය ඉදිකිරීම සඳහා දකුණු පළාත්පාලන කොමසාරිස් වෙතින් 2007 සැප්තැම්බර් 04 දින ලද රු. 75,536 ක මුදල අදාල කාර්යයට නොයොදවා 2011 ඔක්තෝබර් 31 දින වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571 (3) ප්‍රකාර කල් ඉකුත් වූ රු. 561,911 ක් වූ ආපසු වූ ගෙවිය යුතු තැන්පත් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 5.1 හා 8.1 වගන්ති ප්‍රකාර සභාවේ සේවකයින් 15 දෙනෙකු වර්ෂයට හිමි අනියම් හා විවේක නිවාඩු සීමාව ඉක්මවා දින 823 ක් අනුමැතියකින් තොරව සේවයට වාර්තා කර නොතිබුණි.

2.5 <u>ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය</u>

ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා සංයුක්ත සැලැස්මේ ඇතුළත් දැ ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබූ අතර ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලනය</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය